# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2278/21 - 2022 මැයි මස 06 වැනි සිකුරාදා - 2022.05.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය, සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල් අමාත්‍ය එම්. යූ. එම්. අලි සබ්රි වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

**එම්. යූ. එම්. අලි සබ්රි,**
මුදල් අමාත්‍ය.

2022 මැයි මස 06 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි "**2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. මෙම ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසි අදාළ වන්නේ 2022 මැයි මස 20 දින සිට ශ්‍රී ලංකාවේ නැව්තොටුපළ/ගුවන් තොටුපළ වෙත ළඟා වූ භාණ්ඩ සඳහා පමණි.

3. 2011 අංක 1 දරන විශේෂ ආනයන බලපත්‍ර සහ ගෙවීම් ක්‍රම රෙගුලාසි පළ කරන ලද 2012 ජනවාරි මස 02 දිනැති අංක 1739/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* දක්වා ඇති රෙගුලාසිවලට අයත් කොටසක් ලෙස මෙම රෙගුලාසි නිකුත් කරනු ලැබේ. වෙනත් අදාළ අනෙකුත් රෙගුලාසි සමග යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් මෙම *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති රෙගුලාසි බලාත්මක වන්නේය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. විවෘත ගිණුම් ක්‍රමය හෝ භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම,

(අ) තම අපනයන අරමුණු සඳහා අවශ්‍යවන භාණ්ඩ ආනයනයේදී ඔවුන්ගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල හෝ අක්වෙරළ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති අපනයන ඉපයුම්වලින් ගෙවීම් පියවීම සිදු කරන අපනයනකරුවන් ; සහ

(ආ) එම අපනයනකරුවන් සඳහා භාණ්ඩ සපයනු ලබන, විදේශ ව්‍යවහාර මුදල්වලින් ගෙවීම් ලැබ එකී සැපයුම සඳහා එලෙස ඔවුන්ගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ අක්වෙරළ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වෙත ලැබුණු මුදල්වලින් ගෙවීම්කර ආනයනය කරන දේශීය සැපයුම්කරුවන්ට පමණක් භාවිත කිරීම සඳහා අවසර ලැබෙනසේ 2011 අංක 1 දරන විශේෂ ආනයන බලපත්‍ර සහ ගෙවීම් ක්‍රම, පළ කරන ලද 2012 ජනවාරි මස 02 දිනැති අංක 1739/3 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* අංක 3 (I) (ආ) රෙගුලාසිය, සංශෝධනය කරනු ලැබේ.

5. ඉහත රෙගුලාසි අංක 4 හි සඳහන් කිසියම් ආනයනකරුවෙකු ආනයනික භාණ්ඩ ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාෂණය කිරීම සඳහා පහත ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතුය :-

(අ) අදාළ ගෙවීම පියවීම සඳහා ආනයනකරු සතුව විදේශ මුදල්, ඔහුගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙහි හෝ අක්වෙරළ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙහි ඇති බවට ආනයනකරු විසින් වාණිජ ඉන්වොයිසියේ පිටසන් කිරීමක් තම බලපත්‍රලාභී බැංකුවෙන් ලබාගත යුතුය.

(ආ) එම භාණ්ඩ රේගු නිෂ්කාශනය කරන අවස්ථාවේදී එම පිටසන් කරන ලද වාණිජ ඉන්වොයිසිය ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කළ යුතුය.

6. 2011 අංක 1 දරන විශේෂ ආනයන බලපත්‍ර සහ ගෙවීම් ක්‍රම පළ කරන ලද 2012 ජනවාරි මස 02 දිනැති අංක 1739/3 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* අංක 10 දරන රෙගුලාසියට අමතරව ගෙවීම් මත ලේඛන (DP), පිළිගැනීම් මත ලේඛන (DA) යන ගෙවීම් ක්‍රමවලදී, එම DP හෝ DA ක්‍රම යටතේ භාණ්ඩ ආනයනය කිරීමට අදහස් කරන ඉහත *රෙගුලාසි අංක 4හි සඳහන් අය හැර* ඕනෑම ආනයනකරුවෙක් තම බලපත්‍රලාභී බැංකුව සමග පූර්ව විධිවිධාන සකස් කරගත යුතු අතර නෞභාර පත්‍රයේ / ගුවන් භාර පත්‍රයේ නැව් / ගුවන් ගත කළ දිනයට පෙර තම නාමමාත්‍ර ඉන්වොයිසියේ පිටසන් කිරීමක් ලබාගෙන එම පිටසන් කරන ලද නාමමාත්‍ර ඉන්වොයිසිය සමග අනෙකුත් ලේඛන එකී භාණ්ඩ රේගු නිෂ්කාශනය කරන අවස්ථාවේදී රේගු අධ්‍යක්ෂක ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

7. සෑම රේගු ප්‍රකාශනයක්ම පදනම් කරගනිමින් විවෘත ගිණුම් ක්‍රමය හෝ භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යටතේ ගෙවීම් පියවීම සිදු කරනු ලබන ඕනෑම බලපත්‍රලාභී බැංකු විසින් ඊට අදාළ ගණුදෙනු පියවීම් සම්බන්ධ විස්තර පිටපතක් විද්‍යුත් ආකෘතියක් මඟින් රේගු අධ්‍යක්ෂක ජනරාල් වෙත ලබාදිය යුතුය.

8. මෙම රෙගුලාසි ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත හා බලපත්‍රලාභී බැංකු වෙත සුදුසු "මෙහෙයුම් උපදෙස්" නිකුත් කළ යුතුය.

9. ඉහත රෙගුලාසිවලට පටහැනි වන ලෙස ආනයනයන් සිදුකර ඇති විටදී රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් රේගු ආඥාපනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

10. මෙම රෙගුලාසි අර්ථ නිරූපනයේදී යම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව ආනයන හා අපනයන පාලක ජනරාල් ගෙන් විමසිය යුතුය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.